“මැණිකා” රෙදි මැසිමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. ඇය විසින් ගිණුම් තැබීමක් නොකරන නමුත් 2002/2003 වර්ශයේ ශුද්ධ ලාභය දැනගැනිමට කැමත්තක් දක්වයි. ඇය විසින් 2002/03/31 දින හා 2003/03/31 දින පැවති වත්කම් හා වගකිම් පිළිබදව පහත සදහන් තොරතුරු ඔබට ඉදිරිපත් කර ඇත.

| | 2002/03/31 | 2003/03/31 |
|---|---|---|
| මුදල් ශේෂය | 4700 | 4,300 |
| බැංකු ශේෂය | 62,300 | 81,700 |
| ණයගැතියෝ | 31,000 | 29,000 |
| තොගය | 150,000 | 180,000 |
| ආයෝජන | 80,000 | 30,000 |
| උපකරණ- පිරිවැයට | 60,000 | 100,000 |
| ණයහිමියෝ | 50,000 | 60,000 |

පහත සදහන් අමතර තොරතුරු ඔබට ඉදිරිපත් කර ඇත.

(1) 2002/03/28 දින ආදායම් බදු සදහා නිකුත් කල රු 2500 චෙක්පත ගෙවිමට ඉදිරිපත් කර නොතිබුනු අතර ඒවා 2002 අප්‍රේල් මාසයේ ඉදිරිපත් කර ඇත.

(2) තොගය තක්සේරු කර ඇත්තේ විකුණුම් මිළ මතය. 2001/2002 වර්ශය තුල එකතු කර ඇති ලාභ ආන්තිකය විකුණුම් මිළ මත 25% ක් වු අතර 2002/2003 වර්ශය තුල එකතු කර ඇති ලාභ ආන්තිකය පිරිවැය මත 25% ක් විය.

(3) 2002/03/31 දින ණයගැතියන් තුල විකිණිම හෝ ආපසු එවිමේ පදනම මත යැවු රු 10,000 ප්‍රමාණයක් ඇතුළත්ව ඇත.

(4) උපකරණ සදහා ක්‍ෂය විම වාර්ශිකව පිරිවැය මත 10% ක් විය යුතුය.

(5) 2003/03/31 දින බැංකුව විසින් රු 5000 ක චෙක්පත අගරු විම නිසා ආපසු එවා ඇත. එදිනම වෙනත් ගණුදෙනුකරුවෙකු විසින් රු 7000 ක් කෙලින්ම බැංකුවෙ තැම්පත් කර තිබුනි. මැණිකා මේ බැව් දැන නොසිටියාය.

(6) 2002/2003 වර්ශය තුලදි ඇයගේ ගැනිලි මාසිකව රු 5000 බැගින් විය.

(7) 2002/03/28 දිනට ආදායම් බදු සදහා නිකුත් කල රු 31000 ක චෙක්පත ගෙවිමට ඉදිරිපත් කර නොතිබුනි.

ඔබ විසින් 2003/03/31 දිනෙන් අවසන් වු වර්ශය සදහා ඇය විසින් උපයන ලද ශුද්ධ ලාභය හෝ අලාභය ගණනය කරන්න.

(ලකුණු 15)